ජනවාරි 2026
INFORMATION
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පුවත් හසුන

## විදුහල්පතිතුමාගේ පණිවිඩය



# දෙවියන් වහන්සේ කැඳවන්නේ බලා සිටීමට නම්

අයිවෝ පුබාලන්, PhD
විදුහල්පති

ලූක් 2:25-35 ගැන ආවර්ජනයක්

ගම හරහා දිවීමේ මැරතන් තරඟයකට පරීක්ෂකයින් ඉතා වැදගත්ය. කිසිවෙකු පෙනෙන්නට නැති දුෂ්කර භූමි ප්‍රදේශයක් පසුකර යන ධාවකයාට, වංගුවකින් හැරුණු විට, ඉදිරියෙන් සිටින පරීක්ෂකයා දුටු විට ඇති වන්නේ ප්‍රබෝධයකි. ඇය නිවැරදි මාර්ගයේ සිටින බව ක්‍රීඩිකාවට සහතික වන අතර, යා යුතු මාර්ගය ගැන තොරතුරුද ඉන් ලැබේ. එහෙත්, පරීක්ෂකයාට බලා සිටීම හැර කරන්නට කිසිවක් නැත.

මෙසියස් වහන්සේගේ මව ලෙස මරියාගේ මැරතන් ධාවනයේදී ඇයට සහතිකයක් වීමට සහ තොරතුරු සැපයීම සඳහා දෙවියන් වහන්සේ තරඟ පරීක්ෂකයින් තබා තිබුණි. සිමියොන් ඒ අතරින් කෙනෙක් විය. ඔහු බබිලෝනිවරුන් ජෙරුසලම විනාශ කළ දා සිට වසර හයසියයක් පුරා, ඔහුගේ දේශයට නොලැබුණු, "ඉශ්රායෙල්වරුන්ගේ විමුක්තිය" ගැන මහත් ඕනෑකමකින් බලා සිටි කෙනෙකි. කුමන්ත්‍රණ හෝ එකඟතා තුළින් දේශපාලන ගැටලුවලට විසඳුමක් නිර්මාණය කිරීමට උත්සාහ කළ බොහෝ දෙනෙකු මෙන් නොව, සිමියොන් අහංකාර මාර්ග ප්‍රතික්ෂේප කළ කෙනෙකි. ඔහු ධර්මිෂ්ඨ, භක්තිමත් සහ ගැඹුරු ආත්මික කෙනෙක් විය. ඇත්ත වශයෙන්ම, ලූක්, සිමියොන්ගේ ආත්මිකභාවය ගැන තුන් වතාවක් සඳහන් කරයි. ඔහු ආත්මයෙන් පිරුණු (25), ආත්මයෙන් උපදෙස් ගත්තාවූ (26) සහ ආත්මයෙන් මෙහෙයවන ලද්දෙකි (27).

ක්‍රියාකාරීත්වයට ඇබ්බැහි වූ මෙවන් යුගයක, සිමියොන්ගේ ආත්මික කැඳවීම අමුතුම සේවාවක් ලෙස පෙනේ; කිසිවක් කරනවා වෙනුවට, "ස්වාමීන් වහන්සේගේ මෙසියස් වහන්සේ" දකින තුරු බලා සිටීම ඔහුගේ කාර්යය විය. ඔහු කෙතරම් කලක් බලා සිටියාද කිවහොත්, ඔහුට දැනුණේ ඔහු එම කැඳවීමට විලංගු දමා ඇති බවකි. ඔහු එම විලංගුවලින් වහලෙකු බවට පත් වී ඇත්තාක් මෙනි (29). එහෙත් සිමියොන් - ඉවසීමෙන් සහ විශ්වාසවන්තව - "දෙමවුපියන් ළදරු ජේසුස් වහන්සේ රැගෙන එන තුරු" - බලා සිටියේය (27). එය ඔහුගේ විශේෂ කැඳවීමේ උච්චතම අවස්ථාව විය: "සමිඳුනි, ඔබ පොරොන්දු වූ ලෙස ම දැන් ඔබ දාසයා හට, ශාන්ති සිතින් යාමට ඔබ නිදහස දී ඇත, මන්ද, ගැළවීම මාගේ දෙනෙතින් දිටිමි" (29-30).

මරියාට බලවත් සහතිකයක් සහ මඟ පෙන්වීමක් (34-35) ලබාදී, සිමියොන් ශුද්ධ ලියවිල්ලේ පිටුවලින් ඉවත් වේ. එහෙත්, දෙවියන් වහන්සේගේ ගැළවීමේ ශ්‍රේෂ්ඨ නාටකය තුළ විවිධාකාර කැඳවීම් ඇති බවට මතක් කිරීමක් ඉතිරි කරමින් ඔහු ඉවත්ව යයි.

1755 දී ජෝන් වෙස්ලි විසින්, සෑම වසරකම පළමු ඉරිදා දින සඳහා ගිවිසුම් මෙහෙය නිර්මාණය කළ අතර, එමඟින් දෙවියන් වහන්සේගේ සෙනඟට, ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සමඟ ඇති සම්බන්ධතාව හඳුනාගෙන, අලුත් කිරීමෙන් ඔවුන්ගේ ශ්‍රාවකත්වය ශක්තිමත් කර ගැනීමට අවස්ථාවක් උදා විය. වාර්ෂිකව ගිවිසුම අලුත් කිරීම තුළින්, විශේෂයෙන් ඊට ඇතුළත් කැපවීමේ යාච්ඤාව තුළින්, කිතුනු පරම්පරා ගණනාවක් ආශීර්වාද ලබා ඇත:

"මා තවදුරටත් මාගේ නොව ඔබේ ය.
ඔබ කැමති තැනකට මා පත් කළ මැනව,
ඔබ කැමති අය සමඟ මා රඳවන්න;
වැඩ කිරීමට මා යොදවන්න, දුක් විඳීමට මා පත් කරන්න;
ඔබ වෙනුවෙන් රැකියාවක නියැළෙන්නට හෝ
ඔබ වෙනුවෙන් රැකියා විරහිත වීමට සලසන්න.
ඔබ වෙනුවෙන් උසස් වෙන්නෙමි,
ඔබ වෙනුවෙන් පහත් වෙන්නෙමි;
මට පිරී සිටීමට ඉඩ දෙන්න, මට හිස් වීමට ඉඩ දෙන්න,
මට සියල්ල ඇතුව සිටීමටත්,
කිසිත් නැතුව සිටීමටත් ඉඩ දෙන්න.
ඔබ වහන්සේගේ සතුට සහ අභිමතය පරිදි
මම මුළු හදවතින්ම ඔබට භාර වෙමි."

ගැළවුම්කරුවාණන් මෙලොවට බිහි කිරීමටත් උන් වහන්සේ හා සමඟ කුරුසිය සහ ඉන් ඔබ්බට ගමන් කිරීමටත් මරියාගේ මැරතන් ධාවනය විය. සිමියොන්ට තිබුණේ වෙනස් කැඳවීමකි: දෙවියන් වහන්සේගේ පොරොන්දුව විශ්වාස කරමින්, බලා සිට, ගැළවුම්කරුවාණන් දරා සිටින තැනැත්තියට ඉදිරියට යෑමට දිරි දෙන පිණිස රැඳී සිටීම ඔහුගේ කැඳවීම විය.

"පසෙකට වී බලා සිටින්නෝද සේවය කරති" (ජෝන් මිල්ටන්)

## ශුද්ධ ලියවිල්ල තුළ මුල් ඇදීමට ආරාධනයක්



2026 පාඨමාලා විස්තර සටහනේ කවර සැලසුම කුණාටුවකින් පහර කෑ ගසක් නිරූපණය කරයි, එහෙත් එය ශුද්ධ ලියවිල්ලෙහි ගැඹුරින් මුල් බැස ඇති බැවින් ස්ථිරව පවතියි. සමීප වී බලන කල, ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂාවෙන් ලියා ඇති බයිබල් පද ඔබට පෙනෙනු ඇත, එය කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයෙහි බහුභාෂා සංස්කෘතිය සංකේතවත් කරයි. කුණාටු පැමිණෙන විට, ස්ථිරව සිටීමට හැකි වන පරිදි, තමාගේ 'මුල්' ශුද්ධ ලියවිල්ල තුළ ගැඹුරට යෑමට ඉඩ දීමෙන්, ඇදහිල්ල තුළ වර්ධනය වීමට, මෙම කලා කෘතියෙන් ඇදහිලිවන්තයන්ට ආරාධනා කරයි.

ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂාවලින් 2026 පාඨමාලා නාමාවලි පිරික්සීමට හෝ බාගත කිරීමට cts.lk වෙත පිවිසෙන්න.

### මෙම වෙළුමේ...


**නයිසියා සම්මන්ත්‍රණය - 2 පිටුව**

**කොළඹ විසිර සිටින ඇදහිලිවන්තයන්ට දේවධර්මීය අධ්‍යාපනයට ප්‍රවේශ වීමට කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය ඉඩ සලසා දෙයි - 3 පිටුව**

**ගුරු මණ්ඩලයේ පුවත් - 4 පිටුව**

**'බලාපොරොත්තුව අලුත් කිරීම' යූ ටියුබ් මාලාව - 5 පිටුව**

**නායකයන් පුහුණු කිරීම සඳහා කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය සමඟ හවුල් වීම - 6 පිටුව**


### භාර දෙන ලද ඇදහිල්ලේ සම්මන්ත්‍රණය

## වර්තමාන ශ්‍රී ලාංකේය සභාව සඳහා නයිසියාව

වර්තමාන ශ්‍රී ලාංකේය සභාව සඳහා නයිසියානු ඇදහිල්ලේ අදාළත්වය සහ වැදගත්කම සාකච්ඡා කිරීම සඳහා 2025 ඔක්තෝබර් 31 වන දින, නිකායන්හි ප්‍රධානීන්, සභා නායකයන්, දේවධර්මාචාර්යවරුන් සහ දේවධර්ම ශිෂ්‍යයන් එක්රැස් විය.

ප්‍රධාන දේශනය පැවැත්වූයේ ඉන්දියාවේ, දකුණු ආසියානු උසස් ක්‍රිස්තියානි අධ්‍යයන ආයතනයේ (SAIACS) විදුහල්පති ආචාර්ය වරුගීස් ජෝන් මහතා විසිනි.




'නයිසියානු සම්මතය: දෙවියන් වහන්සේගේ ත්‍රිත්ව ජීවිතයේ අභිරහස' යන මැයෙන් පැවති ප්‍රධාන දේශනයට, ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයේ දේවගැති මෙන්ම නුගේගොඩ ශුද්ධවූ මරියා සහ ශුද්ධවූ ජෝන් දේවස්ථානයේ පළාත් භාර දේවගැති, ගෞරවනීය සැමුවෙල් පොන්නයියා ප්‍රතිචාර දක්වන ලදී.



ශ්‍රී ලංකාවේ Christ the Bread of Life පළාතේ, පළාත් අධිකාරි, ගරු ජස්ටින් චව්හාන් පියතුමා, 'නයිසියානු කවුන්සිලය සහ වර්තමාන සභාව' යන මැයෙන් පැවති දෙවන ප්‍රධාන දේශනයට ප්‍රතිචාර දැක්වීය.




තවද, සහභාගිවූවන්, සභා ජීවිතය හා නමස්කාරය තුළ නයිසීන ඇදහිල්ලේ කාර්යභාරය පිළිබඳව සහ දේවධර්මීය ගසාගෙන යෑම්වලින් ආරක්ෂා වීම පිළිබඳව, සාකච්ඡාවලට සහභාගි වූයේ, ලංකා දේවධර්ම විද්‍යාලයේ විදුහල්පතිව සිටි, දේවගැති ආචාර්ය එන්. අරුල්නාදන් මහතා සහ කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ ගුරු මණ්ඩල සාමාජිකයන්ගේ නායකත්වයෙන් පවත්වන ලද ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂා වැඩමුළු හරහාය.









ශ්‍රී ලංකා පදනම් ආයතනයේ (SLFI) පැවති මෙම සම්මන්ත්‍රණය, නයිසියාවේ පළමු කිතුනු කවුන්සිලයේ 1700 වන සංවත්සරය සනිටුහන් කළ අතර, ශ්‍රී ලංකාවේ කිතුනු සභාවේ ප්‍රබෝධවත් රැස්වීමක් විය.






වැඩිදුර කියවීමට ක්ලික් කරන්න

# කොළඹ විසිර සිටින ඇදහිලිවන්තයන්ට දේවධර්මීය අධ්‍යාපනයට ප්‍රවේශ වීමට කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය ඉඩ සලසා දෙයි

ප්‍රථම වතාවට, උතුරු කොළඹ අධ්‍යයන මධ්‍යස්ථානයේ ඉංග්‍රීසි සහ සිංහල මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වීම ඇරඹේ.


'ශ්‍රාවකත්වය' - ආචාර්ය සනත් අතුකෝරාළ (සිංහල)


'නව ගිවිසුමේ සමීක්ෂණ' - ගෞ. රොවිල් බිලොම් (ඉංග්‍රීසි)




තේ වේලාව

පසුගිය සැප්තැම්බර් මාසයේදී උතුරු කොළඹ අධ්‍යයන මධ්‍යස්ථානයේ ඉංග්‍රීසි සහ සිංහල භාෂා පන්ති ආරම්භ කිරීමත් සමඟ කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය තවත් කඩඉමක් සනිටුහන් කළේය. වසර 13ක් පුරා, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය අවට සභාවන්ට දෙමළ මාධ්‍යයෙන් පමණක් පාඨමාලා පවත්වන්නට යෙදුණි. සිසුන්ට වඩා හොඳ පහසුකම් සැපයීමට සහ ධාරිතාව වැඩි කිරීමට, අධ්‍යයන මධ්‍යස්ථානය වෙනත් ස්ථානයකට ගෙන ගොස් ප්‍රතිසංස්කරණය කරන ලදී. දැන් එය ත්‍රෛභාෂා අධ්‍යයන මධ්‍යස්ථානයක් සහ පුස්තකාලයක් ලෙස කටයුතු කරයි.

පිටකොටුවේ වේල්ල වීදියේ තදබදය මධ්‍යයේ, මෙතෝදිස්ත සිටි මිෂන් ගොඩනැගිල්ලේ ඉහළ මහලේ පිහිටුවා ඇති මෙම අධ්‍යයන මධ්‍යස්ථානය, ඒ අවට ජීවත් වන සහ රැකියාවෙන් පසු ඒ ප්‍රදේශය පසුකර යන අයට පහසු ස්ථානයක පිහිටා ඇත.

තමාට තිබූ සෑම ප්‍රශ්නයකටම, සන්දර්භයට අනුකූලව සහ සාක්ෂි සහිතව සාර්ථක පිළිතුරු ලබාගැනීමට හැකි වූ බවත්, එය ශුද්ධ බයිබලය වඩාත් ගැඹුරු මට්ටමකින් තේරුම් ගැනීමට උපකාරී වූ බවත්, ගෞ. රොවිල් බිලොම් විසින් ඉගැන්වූ පළමු ඉංග්‍රීසි මාධ්‍ය පාඨමාලාවට ඇතුළත් වූ නවක ශිෂ්‍යාවක් පැවසුවාය. "මාගේ උපාධි හා පශ්චාත් උපාධි අධ්‍යාපනය අතරතුර අසංඛ්‍යාත දේශනවලට සහභාගී වී ඇති මම, මෙවැනි දෙයක් කිසිදා අත්විඳ නොතිබුණි - එය තවත් එක් දේශනයක් පමණක් නොවේ; එය පුද්ගලිකවම අදාළ වූ සැබවින්ම බලපෑම් සහගත ඉගැන්වීමක් විය. භක්තියෙන් වර්ධනය වීම සඳහා එය මා සසල කළ අතර, ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි දැඩි ප්‍රේමයක් ඇති පුද්ගලයෙකු වීමට මා පෙලඹෙව්වේය."

'ශ්‍රාවකත්වය' පිළිබඳ සිංහල මාධ්‍ය විෂය මෙහෙයවනු ලැබුවේ දේවගැති ආචාර්ය සනත් අතුකෝරාළ විසිනි. පළමු වරට ශිෂ්‍යයෙකු වූ දේවගැතිවරයෙක් මෙසේ අදහස් දැක්වීය: "අපට ශ්‍රාවකත්වය ගැන පැහැදිලිව සහ ක්‍රමානුකූලව ඉගැන්නුවා. ශ්‍රාවකයන් සෑදීමේ වැදගත්කම, ශ්‍රාවකයෙකු යනු කවුද, එය වත්මන් සභාවේ සන්දර්භයට අදාළ කර ගන්නේ කෙසේද සහ අප ඉගෙන ගත් දේ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්නේ කෙසේද යන්න අපි ඉගෙන ගත්තෙමු."

උතුරු කොළඹ අධ්‍යයන මධ්‍යස්ථානයේ භාෂා තුනෙන්ම ග්‍රන්ථ ඇතුළත් වර්ධනය වන පුස්තකාලයක් ද ඇත. සියලුම සභාවල සාමාජිකයන්ට එහි සාමාජිකත්වය විවෘතය.

## කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ ලෝක දූත මෙහෙවර උදෙසා යාච්ඤා සතිය











නොවැම්බර් මාසයේ පැවැත්වුණු වාර්ෂික ලෝක දූත මෙහෙවර උදෙසා යාච්ඤා සතිය, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ ප්‍රජාවට ලොව පුරා සිටින අපගේ ක්‍රිස්තියානි සහෝදර සහෝදරියන් මුහුණ දෙන දුෂ්කරතා සහ සුබ අස්න නොඇසූ ජන කණ්ඩායම් පිළිබඳව ඉගෙන ගැනීමට සහ ඔවුන් වෙනුවෙන් යාච්ඤා කිරීමට අවස්ථාවක් නිර්මාණය කළේය. සිසුන් විසින් සංවිධානය කරන ලද යාච්ඤා පා ගමන මෙහි සුවිශේෂී සිදුවීමක් විය. ගුරු මණ්ඩලය සහ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් සමඟ, ඔවුන් ප්‍රධාන විද්‍යාලයේ අසල්වැසි ප්‍රදේශවල ඇවිද ගොස්, සුබ අස්න සඳහා දොරවල් සහ හදවත් විවෘත වීම උදෙසා යාච්ඤා කළහ. එම කාලය හමාර වූයේ කුකුළු මස් කොත්තු ආහාර වේලක් සමඟ ප්‍රීතිමත් කාලයකිනි!

### යාච්ඤා කිරීමට...

**සිසුන්:** 2027 දී උපාධිය ලබා ගැනීමට කටයුතු කරන සිසුන්ට, අවශ්‍ය පන්ති සහ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමටත්, පර්යේෂණවල මුළු හදවතින්ම නිරත වීමටත්, දෙවියන් වහන්සේ ඔවුන්ට හැකියාව ලබා දෙන පිණිස.

**නවක සිසුන්:** ජීවිත වෙනස් කරන්නාවූ අත්දැකීම් ලබාගෙන, අඛණ්ඩව දෙවියන් වහන්සේගේ වචනය ක්‍රමානුකූලව අධ්‍යයනය කිරීමට ආශාවක් වර්ධනය වන පිණිස.

**ශ්‍රී ලාංකේය සභාව:** සභාව තුළ එකමුතුකම සහ පිබිදීමක් උදෙසා දෙවියන් වහන්සේ, තම සෙනඟ රැකබලා ගන්නට හැකි, දේව භය ඇති පරිණත නායකයන් බිහි කරන පිණිස.

# ගුරු මණ්ඩලයේ පුවත්

## ගෝලීය සභාව තුළ ශ්‍රී ලංකාව නියෝජනය කිරීම



2025 ඔක්තෝම්බර් මාසයේදී ඊජිප්තුවේ ඇලෙක්සැන්ඩ්‍රියාව අසල වාඩි එල් නට්රූන් හි ශාන්ත බිෂෝයි ආරාමයේදී, "දෘශ්‍යමාන එකමුතුකම සඳහා දැන් කොහේද?" යන තේමාව යටතේ පවත්වන්නට යෙදුණු ඇදහිල්ල සහ සාමය පිළිබඳ ලෝක සභා කවුන්සිලයේ 6 වන ලෝක සමුළුවට ආචාර්ය මනෝ ඉමැනුවෙල් සහභාගී වූවාය.

"දෘශ්‍යමාන එකමුතුකමකින් ජීවත්වීම" යන මාතෘකාව යටතේ අවසාන දිනයේ පැවති පූර්ණ සැසියකදී, විවිධ කලාප සහ සන්දර්භයන්ගෙන් පැමිණි දේවධර්මාචාර්යවරුන් සමඟ ඇය ද කථා කළාය.






2025 නොවැම්බර් මාසයේදී ඊජිප්තුවේ ලෝගෝස් පාපල් මධ්‍යස්ථානයේ පැවති ලුසාන් ඕතඩොක්ස් මුලපිරීමට නතානියෙල් සෝමනාදන් සහභාගී විය.

"දකුණු ආසියානු එවැන්ජලිස්ත සහ පෙන්තකොස්ත ඇදහිලිවන්තයන් නයිසීන ඇදහිල්ල සමඟ සම්බන්ධ විය යුතු නව ක්‍රම" යන මැයෙන් පැවති සැසියක් සඳහා කරුණු ඉදිරිපත් කිරීමට ඔහුට ආරාධනා කරන ලදී. මෙම හමුව අතරතුර, ඕතඩොක්ස් කිතුනුවන් සහ එවැන්ජලිස්තවරුන් අතර උණුසුම් හා ප්‍රබෝධවත් කිතුනු හමුවීමට ඔබ්බෙන්, ඔහුට කොප්ටික් අධ්‍යාත්මික භූමියේ සිටීමේ ගැඹුරු අත්දැකීමද ලැබුණු බව ඔහු බෙදා ගන්නා ලදී.





ආචාර්ය අයිවෝ පුබාලන් 2025 අගෝස්තු මාසයේදී, ආසියානු දේවධර්ම සංගමයේ ත්‍රෛවාර්ෂික මහා සභා රැස්වීමට සහභාගී විය. "කැළඹිලි සහිත ලෝකයේ ක්‍රිස්තුන් වහන්සේ වැනි නායකත්ව නිර්මාණය" යන තේමාව යටතේ එය පවත්වන ලද්දේ, තායිපේ හිදී ය.





අධ්‍යාපන පීඨාධිපති ගෞ. රවින් කල්දේරා, තායිලන්තයේ චියැං මායි හි පැවති, ගෝලීය ප්‍රතිසංස්කරණ සභා හවුලේ 27 වන මහා කවුන්සිලයට සහභාගී විය. මෙය, "දිගින් දිගටම ඔබේ සාක්ෂියේ පවතින්න" යන තේමාව යටතේ ඔක්තෝබර් මාසයේදී මෙය පැවැත්විණි.






2025 ඔක්තෝම්බර් මාසයේදී දකුණු කොරියාවේ පැවති ලෝක ධර්මදානී සන්ධානයේ මහා සභා රැස්වීමට ආචාර්ය සනත් අතුකෝරාළ සහභාගී විය. මෙම අවස්ථාවට ලොව පුරා සිටින ධර්මදානී නායකයන්, ජාතික සන්ධාන නියෝජිතයන් සහ හවුල්කරුවන්, "2033 වන විට සැමට සුබ අස්න" යන තේමාව යටතේ එක්සත් විය.



# සුභ පැතුම්!

## මහාචාර්ය අන්බහන් අරියදුරෙයි මහතා 2025 AAOU ප්‍රශංසනීය සේවා සම්මානයෙන් පිදුම් ලැබීම




ආසියානු විවෘත විශ්වවිද්‍යාල සංගමය විසින් 2025 වසරේ AAOU කීර්තිමත් සේවා සම්මානය, කවුන්සිල සාමාජික මහාචාර්ය අන්බහන් ආරියදුරෙයි වෙත පිරිනමන ලදී. 1997 සිට සෑම වසරකම එක් පුද්ගලයෙකුට පිරිනමන මෙම ගෞරවනීය සම්මානය, විවෘත හා දුරස්ථ අධ්‍යාපනයේ දියුණුව සඳහා කැපී පෙනෙන දායකත්වය සහ කැපවූ සේවය ඇගයීමට ලක් කරයි. වසර 29ක ඉතිහාසය තුළ ශ්‍රී ලංකාවෙන් මෙම සම්මානය ලැබූ සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් මෙම සම්මානය ලැබූ පළමුවැන්නා මහාචාර්ය අන්බහන් ය.

## WEA ජාත්‍යන්තර කවුන්සිලයේ සභාපති ලෙස ගොඩ්ෆ්‍රි යෝගරාජා මහතා පත් වේ




කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයෙහි ආරම්භක කවුන්සිලයේ සාමාජිකයෙකු වන ගොඩ්ෆ්‍රි යෝගරාජා මහතා, 2025 ඔක්තෝම්බර් මාසයේදී කොරියාවේ සෝල් හි පැවති ලෝක ධර්මදානී එලායන්ස් ජාත්‍යන්තර කවුන්සිලයේ මහා සභා රැස්වීමේදී එහි සභාපති ලෙස පත් විය. යෝගරාජා මහතා ආසියානු ධර්මදානී සන්ධානයේ සභාපතිවරයා සහ ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි ධර්මදානී සන්ධානයේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙසද කටයුතු කරයි.

## කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයෙහි බාහිර කථිකාචාර්යවරුන්

### ආචාර්ය ටබෙයා බයින්ඩර්



එස්රා-නෙහෙමියා-එස්තර් - අභියෝගාත්මක කාලවලදී මෙම නායකයන් ධෛර්යය සහ බලාපොරොත්තුව තබා ගත් ආකාරය.

යෙසායා - අද්‍යට අදාළ කිරීම් සමඟ යෙසායාගේ පණිවිඩය, ඓතිහාසික පසුබිම, කර්තෘත්වය සහ තීරණාත්මක ගැටලු අධ්‍යයනය කිරීම.

ක්‍රිස්තියානි අධ්‍යාපනඥයා සංවර්ධනය කිරීම - සිසුන්ට මූලික අධ්‍යාපනික සහ නායකත්ව නිපුණතා ලබා ගැනීමට උපකාර වන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවක්.

### ආචාර්ය හවිලා ධර්මරාජ්



'1 සහ 2 රාජාවලිය'

ශාස්ත්‍රපති උපාධි සිසුන්ට දෙවියන් වහන්සේ සහ උන් වහන්සේගේ ලෝකය, උන් වහන්සේගේ සෙනඟ වන ඉශ්රායෙල්වරුන් සමඟ උන් වහන්සේගේ අන්තර් ක්‍රියා කිරීම තුළින් තේරුම් ගැනීමටත්, මේ තුළින් ජේසුස් වහන්සේගේ විශ්වාසවන්ත අනුගාමිකයන් විය හැකි ආකාරයත් ඉගෙන ගැනීමට අවස්ථාව ලැබුණි.

### ආචාර්ය ඩේවිඩ් සී ගුඩ්වින්



'මානව සංවර්ධනය පිළිබඳ හැඳින්වීම'

සංවර්ධන අවධීන් අධ්‍යාත්මික වර්ධනයට බලපාන ආකාරය සහ මනුෂ්‍යයන්ගේ පෞද්ගලික සහ ඇදහිල්ලේ ගමනේදී, එළදායී ලෙස ඔවුන්ට සහය විය හැක්කේ කෙසේදැයි ඉගෙන ගැනීමට සිසුන්ට හැකියාව ලැබුණි.

## බලාපොරොත්තුව අලුත් කිරීම

ප්‍රායෝගික අවබෝධය | දිරිගැන්වීම | බයිබලයානුකූල සත්‍යය

බලාපොරොත්තුව අලුත් කිරීම පිළිබඳ විශේෂ සම්මුඛ සාකච්ඡා මාලාවක් කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය විසින් ඉදිරිපත් කරන ලදී. පෞරුෂ වර්ග තේරුම් ගැනීම, සෞඛ්‍ය සම්පන්න සබඳතා වර්ධනය කිරීම සහ කම්පනයේ බලපෑම සහ එයින් අපට සුවය ලබා ගත හැකි ආකාරය අවබෝධ කර ගැනීම තුළින් බලාපොරොත්තුව අලුත් කරන්නේ කෙසේද යන්න පිළිබඳව ගුරු මණ්ඩලයේ සාමාජිකයෙකු සහ ආදි ශිෂ්‍යයෙකු සාකච්ඡා කරන ආකාරය වීඩියෝවල දැක්වේ.

**නැරඹීමට මෙතන ක්ලික් කරන්න**

YouTube









# පරිවර්තනය වූ නායකයන් ප්‍රජාවන් පරිවර්තනය කරයි.

## ශ්‍රී ලංකාව තුළ ක්‍රිස්තු ගුණැති නායකයන් ගොඩනැගීමට ඔබ කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය හා සම්බන්ධ වනවාද?

**දිවයින පුරා කොළඹ දේවධර්ම ශාස්ත්‍රාල සිසුන්ගෙන් ලැබුණු උද්යෝගිමත් වාර්තා කිහිපයක් මෙසේ දක්වමු**



**බස්නාහිර පළාත**

**වෘත්තියෙන් අන්තර්ගත ලේඛක, පුහුණු උපදේශක**

මා ඉගෙන ගත් සෑම දෙයක්ම වෘත්තීයමය වශයෙන් මිනිසුන් සමඟ වැඩ කිරීම සඳහා ඇදහිය නොහැකි පදනමක් ලබා දුන්නා පමණක් නොව, මාගේ සියලු සබඳතාවලදී වඩා හොඳින් සවන් දීමට සහ සංවේදනය කිරීමට ඉගෙන ගත් බැවින්, මා පෞද්ගලිකව වඩා හොඳ මිතුරෙකු, උපදේශකයෙකු, බිරිඳක සහ දියණියක බවට පරිවර්තනය කර ඇත. ජීවිතයේ බොහෝ කලකට පෙර මා මෙම කුසලතා ඉගෙන ගත්තා නම් හොඳ යැයි සිතෙයි!



**උතුරු පළාත**

**වෘත්තියෙන් කොණ්ඩා මෝස්තර ශිල්පියෙක්, සහ සභාපාලක සහ බන්ධනාගාර සන්දර්භ තුළ සේවය කිරීම**

මාගේ කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ ගමන පරිවර්තනීය එකක් විය. එය මාගේ බයිබලයානුකූල දැනුම ගැඹුරු කළා පමණක් නොව; එය මාගේ අධ්‍යාත්මික ඇස් විවෘත කළේය. මාගේ පෙර අත්දැකීම් මත පදනම් වූ දේශනාවලින් ඔබ්බට ගොස්, බයිබලය නිසි ලෙස මෙනෙහි කිරීමට, පර්යේෂණ කිරීමට සහ දේශනා කිරීමට මම ඉගෙන ගත්තෙමි. මෙම අධ්‍යයනයන් මාගේ පෞද්ගලික වර්ධනය සහ දේවසේවයේ කාර්යක්ෂමතාව බෙහෙවින් වැඩි දියුණු කළේය.



**දකුණු පළාත**

**සභාපාලක**

අවුරුදු 17ක් අපස්මාරයෙන් පීඩා විඳි පසු, මම උදේ සහ සවස භාවිත කළ ඖෂධ දෙක ගැනීම නැවැත්තුවෙමි. එම වසරේම, මම දෙවියන් වහන්සේට සේවය කිරීමට කැප වුණා. පසුව මට කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයෙහි ඉගෙනීමට අවස්ථාව ලැබුණා. බොහෝ බාධක සහ දුෂ්කරතා මධ්‍යයේ මට ඉගෙනීමට සිදු වුවද, එම කාලය මාගේ ජීවිතයේ ස්වර්ණමය පරිච්ඡේදයක් විය. දෙවියන් වහන්සේ මට කරුණාවන්ත වූ සේක.

**උතුරු මැද පළාත**

**වෘත්තීයෙන් සඟරා කර්තෘ, සහ යෞවනයන්ට සේවය කිරීම**

මම සේවය කරන්නේ දෙවියන් වහන්සේ හෝ දෙවියන් වහන්සේගේ වචනය ඉක්මනින් පිළිගන්නේ නැති වර්තමාන තරුණ පරම්පරාව අතරයි. ඔවුහු බොහෝ විට සැක සහිත වන අතර ප්‍රශ්න ඇසීමට වැඩි නැඹුරුවක් දක්වති. කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයෙහි දී මා ලත් අධ්‍යාපනය නිසා මට පැකිළීමකින් තොරව ඒවාට පැහැදිලි පිළිතුරු දීමට හැකි වී තිබේ.



**නැගෙනහිර පළාත**

**ඉරිදා පාසල් ගුරුවරයකු සහ සභාපාලකයෙකු**

සෑම පාඩමක්ම මාගේ පෞද්ගලික ජීවිතයේ විප්ලවීය වෙනසක් ඇති කර ඇත. කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පාඨමාලා මා භාරගත් දේවසේවයේ වඩා හොඳින් ක්‍රියා කිරීමට මට උපකාර කරයි. ගුරුවරුන්ගේ පෞද්ගලික කතාබහ මට සැනසීමක් ගෙන දෙන බව මට පෙනෙන අතර ඒවා මට අර්ථවත් ලෙස ජීවත් වීමට උපකාර කර ඇත. දැන් පවා අපි යම් යම් ගැටලුවලට මුහුණ දෙමින් සිටිමු, එහෙත් කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය වෙතින් ඉගෙන ගත් පාඩම් මේ සියලු ගැටලු ජය ගැනීමට මට ධෛර්ය ලබා දෙයි.

**ශිෂ්‍යත්ව ආධාර නොතිබුණේ නම් කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ සිසුන්ගෙන් බහුතරයකට දේවධර්මීය අධ්‍යාපනයේ නියැළීමට නොහැකි වනු ඇත. ශ්‍රී ලංකාවෙන් සහ ලොව පුරා සිටින ඇදහිලිවන්තයන්ගේ ත්‍යාගශීලී දීමනා තුළින් මෙම යෝජනා ක්‍රමය පවත්වා ගෙන යන අතර එමඟින් දේවධර්ම අධ්‍යාපනයට මූල්‍යමය වශයෙන් මහත් උපකාරයක් කළ හැකිය.**

## කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයෙහි ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමයට ඔබ මාසිකව රුපියල් 5,000 (ඇ.ඩො. 17) හෝ ඊට වැඩි පරිත්‍යාගයක් ලබා දීම, එළදායී ක්‍රිස්තියානි සේවය සඳහා ඇදහිලිවන්තයන් සන්නද්ධ කිරීමට කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය හට අඛණ්ඩව උපකාරී වනු ඇත.

ලබා දෙන ආකාරය

- **බැංකු ප්‍රේෂණ සහ විදේශ මුදල් යැවීම (ඇ.ඩො. සහ කැ.ඩො.)**
  වැඩි විස්තර සඳහා අප හා සම්බන්ධ වන්න!

- **චෙක්පත්**
  කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ **නමට ලියන්න** (ගෙවීම් ලබන්නා)
  විදුහල්පති, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය, 189, දුටුගැමුණු වීදිය,
  කොහුවල, ශ්‍රී ලංකාව **වෙත එවන්න**

වැඩි විස්තර සඳහා සම්පත් සංවර්ධන කළමනාකාර, රොෂෙල් හේකල්-රණසිංහ අමතන්න
+94 77 350 2930 | rochelle@cts.lk

www.cts.lk | +94 11 2890809